www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපදයෙහි මිලියන හයකට ආදායමක් ලෙස ඇත්තේ ආහාර මුද්දර පමනයි

## Six million in the US with no income but food stamps

2010 ජනවාරි 7

*නිව් යෝක් ටයිම්ස්* පුවත්පත රාජ්‍ය දත්ත පිලිබඳව කල විශ්ලේෂනයකට අනුව මිලියන හයකට ආසන්න ඇමරිකානු ජනයා ජීවත් වන්නේ ආහාර මුද්දර වශයෙන් මාසිකව ලැබෙන ඩොලර් 100ක හෝ 200ක මුදල හැර අන් කිසි ආදායමක් නැතිව ය. එනම්, එක්සත් ජනපදයෙහි වෙසෙන සෑම පනස් දෙනෙකුගෙන් ම එක් අයෙකු දිවි රැක ගන්නේ ආහාර මුද්දරවලිනි. තමන් විරැකියන් යැයි ද සුභසාධනයක් ලෙස වත් විරැකියා රක්ෂන දීමනාවක්, විශ්‍රාම වැටුප් ප්‍රතිලාභයක්, ලමා රැකවරන සහායක් හෝ ආබාධිත දීමනාවක් ලෙස වත් කිසිදු මුදල් ආධාරයක් නොලබන්නේ යැයි ද වාර්තා කල ජන සංඛ්‍යාව පසු ගිය දෙවසර තුල දී සියයට 50කින් පිම්මේ ඉහල ගොස් ඇතැයි පුවත්පත වාර්තා කලේ ය.

ජනවාරි 3 දා ලිපිය අනුව, පසු ගිය දෙවසර තුල දී නෙවාඩාහි තුන් ගුනයකින් ද ෆ්ලොරිඩාහි සහ නිව් යෝක්හි දෙගුනයකින් ද මිනෙසෝටාහි සහ උ‍ටාහි සියයට 90කින් ද කිසිදු ආදායමක් නැති බවට වාර්තා වන ජන සංඛ්‍යාව වැඩි විය. වේන් ප්‍රාන්තයේ, මිචිගන්හි සෑම නිවැසියන් 25 දෙනෙකුගෙන් ම එක් අයෙක් තමන් ආහාර මුද්දර ආදායම පමනක් ලබන බව වාර්තා කරයි. ජනගහනයෙන් අඩක් විරැකියන් හෝ හැකියාවලට සරිලන රැකියා නොලද්දවුන් වන ඩෙට්‍රොයිට් ප්‍රදේශය ද අයත් වන්නේ මෙම මිචිගනයට යි. යකිමා ප්‍රාන්තයට අයත් වොෂින්ටනයෙහි එම සංඛ්‍යාව සෑම 17 දෙනෙකුට ම එක් අයෙකි.

නව දශකය ආරම්භ වෙද්දී සහ ආර්ථික "ප්‍රකෘතිමත් වීමක්" පිලිබඳ මුසාව පෙරට දැමෙන අතරෙහි එක්සත් ජනපදය තුල පැතිර පවත්නා මානව දුක්පීඩාවල දැවැන්ත පරිමානය මෙම සංඛ්‍යාවලින් එලිදරව් වේ. කුටුම්බ ලෙස දිවි ගෙවන ජනයාගෙන් මිලියන 6කට - මෙයින් මිලියන 1.2ක් ළමුන් ය - කිසිදු ආදායමක් නැත. එය ඉන්ඩියානාහි හෝ මැසචුසෙට්ස්හි මුලු ජනගහනයට හෝ ලොස් ඇන්ජලිස්හි, ෆිලඩෙල්ෆියාවෙහි සහ බොස්ටන්හි වෙසෙන ජනගහනයෙහි එකතුවට සමාන සංඛ්‍යාවකි.

මෙබඳු මහා සමාජ විනාශයකින් අවධාරනය වන්නේ ඔබාමා පාලනාධිකාරය දක්වන නොසැලකිල්ල යි. මූල්‍ය ප්‍රභූවේ ඉරනම යහපත් අතට හැරවීමට මුක්කුව දීම සඳහාත් තමන් කර ගෙන යන යුද්ධවලට අරමුදල් සැපයීම සඳහාත් සෑම වියදමක් ම කරද්දී තම රැකියා, නිවාස සහ ජීවනෝපායන් අහිමි වූවන්ට සහන සැපයීම සඳහා එය සැබවින් ම කිසිවක් කර නැත.

ආදායමක් නැති ජන සංඛ්‍යාව ඉහල යාම ඇරඹුනේ 1996 පටන් ය. ඩිමොක්‍රැටික් ජනාධිපති බිල් ක්ලින්ටන් ද රිපබ්ලිකන් කොන්ග්‍රසය ද සුභසාධනය පොදු හිමිකමක් ලෙස පැවතීම අවසන් කලේ එම වසරෙහි ය. 1930 ගනන්වල දී ෆෙඩරල් සහන වැඩ සටහන ඇරඹුනු තැන් පටන් එය එහි අංගයක්ව තිබින. "පරාධීනතා චක්‍රය අවසන් කිරීම" පිලිබඳ පොරොන්දු දෙමින් ඩිමොක්‍රැටිකයෝ ද රිපබ්ලිකානුවෝ ද ප්‍රතිලාභ මත යාවජීව සීමාවන් පැනවූහ, මුදල් සහනාධාරයේ මට්ටම දැඩි ලෙස පහත හෙලූහ, ආධාර ලැබීමට නම් යමෙකු තමන්ට යම් නියමිත "ශ්‍රම කුලියක්" ලැබෙන බවට හිමිකම් පෑ යුතු යැයි ද තවත් අවශ්‍යතා ද සපුරා ලිය යුතු යැයි ද නියම කලහ.

සහන සඳහා වන අවශ්‍යතාව එන්න එන්න ම වැඩි වෙමින් තිබිය දීත්, "දුප්පත් පවුල් සඳහා තාවකාලික සහනාධාර" නමින් හැඳින්වෙන සුභසාධන වැඩසටහනෙන් දැනට ඉතිරිපහදුව පවතින සහන වැඩ පිලිවෙලවල් වෙනුවෙන් කිසිදු අතිරේක අරමුදලක් සැපයීමට ඔබාමා විරුද්ධ වී ඇත. *ටයිම්ස්* පුවත්පත වාර්තා කරන පරිදි, සුභසාධන ආධාර සැපයීම ඉහල ම මට්ටමට නැගී ගියේ 1990 ගනන්වල දී වන අතර, එතැන් පටන් සියයට 75කට ආසන්න ප්‍රමානයකින් සුභසාධන ලැයිස්තුව කපා හැරී ඇත.

"පහු ගිය අවපාත කාලවල දී මුදල් සහනාධාර ලැබුනු අයගෙන් බොහොමයකට දැන් ඒවා ලැබෙන්නේ නැහැ," මිචිගන් මානුෂික සේවා සංගමයේ ප්‍රකාශිකාවක වන ජූඩි පුට්නම් ලෝක සමාජවාදී වෙබ් අඩවියට පැවසුවා ය. "1996 දී 'සුභසාධන ප්‍රතිසංස්කරන' සිද්ධ වෙන්න කලින් ජනපදය තුල දරිද්‍රතාවෙහි ජීවත් වූ ළමුන්ගෙන් තුනෙන් දෙකකට

මුදල් සහනාධාරය ලැබුනා. ඒත් දැන් ලැබෙන්නේ තුනෙන් එකකට විතර යි. මිචිගන්වල මහජනයා බොහෝ දුරට ම ආහාර මුද්දර මත රැඳිල යි ඉන්නෙ."

විරැකියා ප්‍රතිලාභ ලැබෙන්නේ විරැකියන්ගෙන් අඩකට පමනක් වන තතු යටතේ ආහාර මුද්දරය අවසන් ආරක්ෂක දැලක් බවට පත්ව ඇත. ආහාර මුද්දර සහනාධාරය යටතේ පුද්ගලයෙකුට ආහාර වේලක් සඳහා ඩොලර් 1ක මුදලක් සැපයේ; නැත හොත්, නිල දරිද්‍රතා මට්ටම ලෙස ගැනෙන ආදායමෙන් සියයට 130ක් දක්වා උපයන පුද්ගලයන් හෝ පවුල් සඳහා සෑම මසකට ම පුද්ගලයෙකුට ඩොලර් 100කට ආසන්න මුදලක් සැපයේ. වාර්තා වන පරිදි, මිලියන 36ක් ජනයා දැන් ආහාර මුද්දර වැඩ සටහන ගැන බලාපොරොත්තු තබා සිටිති. එනම්, සෑම පුද්ගලයන් අට දෙනෙකුගෙන් ම ද සෑම ලමුන් හතර දෙනෙකුගෙන් ම ද එක් අයෙකි. ඒකාබද්ධ ෆෙඩරල්-රාජ්‍ය අතිරේක පෝෂන සහනාධාර වැඩ සටහනට (SNAP) දිනකට අලුතෙන් 20,000ක ජන සංඛ්‍යාවක් එක් වෙමින් පවතින මුත්, තව මත් තක්සේරු කෙරෙන්නේ සුදුසුකම් ඇති ජනයාගෙන් තුනෙන් දෙකකට පමනක් සිය සේවා සැපයීමට යි.

කලින් සිදු කරන ලද *ටයිම්ස්* අධ්‍යයනයකින් පෙන්නුම් කෙරුනු පරිදි, ආහාර මුද්දර භාවිතය අඩු ගනනේ තුනෙන් දෙකකින් වත් වේගයෙන් ඉහල ගිය එක්සත් ජනපද ප්‍රාන්ත 200කට වැඩි ගනනක් පවතී. රිවර්සයිඩ් ප්‍රාන්තය, කැලිෆෝනියාව, වඩා විශාල ෆීනික්ස් සහ ලාස් වේගාස් ප්‍රාන්තවලින් වැඩි කොටසක්, ඇට්ලැන්ටා නගරබද වෘත්තාකාර ප්‍රදේශයක් සහ දකුනුදිග ෆ්ලොරිඩාවේ බ්‍රැඩෙන්ටන් සිට එවර්ග්ලේඩ් දක්වා වූ සැතපුම් 150ක ප්‍රදේශයක් ද මේ අතරට ඇතුලත් ය.

සියලු ලමුන්ගෙන් සියයට 50ක් ද අප්‍රිකානු ඇමරිකානු ලමුන්ගෙන් සියයට 90ක් ද සිය 20 වන උපන් දිනයට කලින් යම් අවස්ථාවක ආහාර මුද්දර ලබනු ඇතැයි පෙන්නුම් කරන අධ්‍යයනයක් සාන්ත ලූයීහි වොෂින්ටන් විශ්ව විද්‍යාලයේ පර්යේෂකයෝ පසු ගිය වසරේ අග භාගයේ දී ප්‍රසිද්ධ කලහ.

"සුරක්ෂිතතාවෙන් සහ ආරක්ෂාවෙන් සමන්විත කාල පරිච්ඡේදයක් වනවා වෙනුවට, බොහෝ ඇමරිකානු ලමුන්ගේ ලමා විය ආර්ථික අවුල් වියවුල්වලින් ද අවදානමෙන් ද දුෂ්කරතාවෙන් ද පිරි සමයක් බවට පත් වී ඇතැ"යි වාර්තාවේ කතුවරයෙකු වන මාක් රැන්ක් (Ph.D.) පැවසී ය.

ජනවාරි 3 දා *ටයිම්ස්* වාර්තාව ෆ්ලොරිඩාව කෙරෙහි අවධානය යොමු කලේ ය. එහි ආහාර මුද්දරවලට පිටින් ආදායමක් නැති ජන සංඛ්‍යාව දෙවසරක් ඇතුලත දෙගුනයක් වී ඇත. නිවාස උකස්කරයන් අත්හිටුවන ලැබ නිවාස අත් හැර දැමීමට සිදු වීම නිසා නිවාසකරන උත්පාතය නිවාසවල කම්මුතුවක් බවට පරිවර්තනය වූ එහි දකුනුදිග වෙරලබද ප්‍රදේශයෙහි තුන් ගුනයකටත් වැඩි ප්‍රමානයකින් එම සංඛ්‍යාව ඉහල ගොස් ඇත. රාජ්‍ය දත්තවලට අනුව, ආදායමක් නැති අයගෙන් අඩක් ලමුන් සහිත පවුල්වල අය වූහ, අඩක් තනි පුද්ගලයෝ වූහ. පීඩාවට පත් වූවන් වාර්ගිකව ද වර්ග කල හැකි විය. සියයට 42ක් පමන සුදු ජාතිකයෝ ද සියයට 32ක් පමන කලු ජාතිකයෝ ද සියයට 22ක් ලතින් භාෂාව කතා කරන්නෝ ද වූහ. අවපාතය අතරතුර දී වේගයෙන් ම වර්ධනය වෙමින් පවතින්නේ සුදු ජාතිකයන්ගේ ප්‍රතිශතය යි.

මෙම අසරන භාවයෙහි ගිලී යාමෙන් ජනගහනයේ පුලුල් ස්තරයක් පීඩාවට පත්ව ඇත. *ටයිම්ස්* ලිපිය දරුවන් දෙදෙනෙකු සිටින මැදි වියේ මවක වන ඉසබෙල් බර්මියුඩෙස් පල කල අදහස් උපුටා දැක්වී ය. බ්‍රොන්ක්ස්හි නිවාස ව්‍යාපෘතියක සිට ෆ්ලොරිඩාවේ වෙන්දේසි වත්තක පිහිටි නිවසකට පදිංචිය මාරු කරන්නට ඇයට සිදු වූයේ, කලෙක ලක්ෂයකට වැඩි ආදායමක් ලැබ පිහිනුම් තටාකයක් ද ආයෝජන දේපල ද සහිතව සිටි ඇයට සිය රැකියාව සහ නිවස අහිමි වී විරැකියා ප්‍රතිලාභවලින් දිවි රැක ගන්නට සිදු වූ නිසා ය. දැන් බර්මියුඩෙස් මහත්මියගේ එක ම ආදායම් මාර්ගය වන්නේ මසකට ඩොලර් 320ක් වන ආහාර මුද්දර දීමනාව යි. "ඩොලර් 180,000ක ආදායමක් ලබපු මම ආහාර මුද්දරවලින් රැකෙන තැනට වැටුනා," ඇය පුවත්පතට පැවසුවා ය. ආහාර මුද්දර වැඩ සටහන නොතිබුනේ නම් තමන්ට තම දරුවන්ට ආහාර ලබා දිය නොහැකි වනු ඇති බව ද ඇ කීවා ය.

එන්න එන්න ම වැඩි වැඩියෙන් සොච්චම් ආහාර මුද්දර දීමනා මත රැඳෙන්නට සිදු වීමෙන් අනාවරනය වන්නේ එක්සත් ජනපදය තුල සමාජ ආරක්ෂන ජාලයක් යැයි නිවැරදිව හැඳින්විය හැකි කිසිවක් නැතිකම යි. වෝල් වීදියට ඇප වීම සඳහාත් එක්සත් ජනපද මිලිටරි ක්‍රියාවන් ලොව පුරා ව්‍යාප්ත කිරීම සඳහාත් ඩොලර් ට්‍රිලියන ගනන් ගෙවන්නට රජයේ අරමුදල්වලින් පවත්වා ගෙන යන වැඩ සටහන්වලින් ඉතිරිපහදුව පවතින සියලු දේට ම පහර දෙන්නට ඩිමොක්‍රැටිකයන් සහ රිපබ්ලිකානුවන් සූදානම් වන තතු තුල තත්ත්වය වඩා නරක අතට හැරෙනවා පමනකි.

ඊලඟ මාසයේ මුල දී ඔබාමා රාජ්‍ය තත්ත්ව දේශනයේ තේමාව දිගු කාලීන හිගය අඩු කිරීම සහ ඇමරිකානු මහජනයා තම පරිභෝජනය තව දුරටත් අඩු කල යුතු යැයි කරන ඉල්ලීමක් වනු ඇත. ධවල මන්දිරය පරිභෝජනය මත ප්‍රතික්‍රමන බදු පනවමින් මූලික සමාජ වැඩ සටහන්වල ප්‍රධාන ගනයේ කපා හැරීම් නිර්දේශ කරන්නට නියමිත ද්විපාර්ශ්වීය කොමිසමකට සහාය දෙමින් සිටින අතර, පෙබරවාරියේ දී ඉදිරිපත් කිරීමට නියමිත මීලඟ අයවැයෙහි හිගය අඩු කිරීම සඳහා පාලනාධිකාරය පියවර ගනු ඇතැයි ඔබාමාගේ අයවැය අධ්‍යක්ෂ පීටර් ඕර්සැග් පවසා ඇත.

එවැනි පියවරයන් තවත් මිලියන ගනනක් දරිද්‍රතාවට ඇද දමනු ඇත.

අතිමහත් බහුතරයේ වියදමෙන් ධනවත් සුලු පිරිසකට වාසි සලසන ආර්ථික ක්‍රමයක් වන ධනවාදයේ අසාර්ථකත්වය පිලිබඳ වඩාත් ම සුචිත්‍රිත ප්‍රකාශනය වන්නේ වැඩ කරන ජනයා මුහුන දෙන සමාජ අර්බුදය යි; එනම් විරැකියාව අවපාත සමයේ මට්ටම්වලට පත් වීම, නිවාස උකස්කර අත්හිටුවීම, හාමත, දරිද්‍රතාව සහ නිවාස නැතිකම වර්ධනය වීම වැඩ කරන ජනතාව සම්බන්ධයෙන් ගත් විට වඩාත් නරක අතට හැරෙමින් පවතින මෙම තත්ත්වය මධ්‍යයේ අබල වත්කම් සහන වැඩ සටහන යටතේ රජයේ අරමුදල්වලින් දසබිලියන සංඛ්‍යාත මුදලක් පැහැර ගත් ඉහල පෙලේ බැංකු තුනක් - ගෝල්ඩ්මන් සැක්ස්, ජේ.පී. මෝර්ගන් චේස් සහ මෝර්ගන් ස්ටැන්ලි - ඩොලර් බිලියන 49.5ක වසර අවසාන ප්‍රසාද දීමනා සහ ව්‍යාපාර වස්තු දීමනා බෙදා දෙන්නට යන බව පසු ගිය සතියේ වාර්තා විය. මේ සියල්ලෙන් කියැවෙන්නේ එක්සත් ජනපද බැංකු මුලු වන්දි වශයෙන් ඩොලර් බිලියන 200කට ආසන්න මුදලක් අත හැර දමන්නට යන බව යි.

ඔබාමා පාලනාධිකාරය වැඩ කරන ජනයාගේ ධනය මහා අවපාතයෙන් මෙපිට හට ගත් නරක ම ආර්ථික බිඳ වැටීම ඉක්මන් කිරීම සම්බන්ධයෙන් වගකිව යුත්තන් අතට පවරා දීම දිගින් දිගට ම ද වේගවත් ද කරමින් සිටී.

සිය තිලයෙහි වැඩ අරඹා වසරකට ආසන්න කාලයකට පසුව ජනාධිපති ඔබාමා පෙන්නුම් කර ඇත්තේ තමන් මූල්‍ය කතිපයාධිපත්‍යයේ උපකරනයක් විනා අන් යමක් නොවන බව යි. කම්කරු පන්තියේ සැබෑ අනාගතය රඳා පවතින්නේ පාලනාධිකාරයට, මහ ධනපතියන්ගේ පක්ෂ දෙකට සහ ඔවුන් ආරක්ෂා කරන ලාභ ගැරීමේ පද්ධතියට එරෙහිව මහජන සමාජවාදී ව්‍යාපාරයක් වර්ධනය කිරීම මත ය.

**ජෙරී වයිට්**

© www.wsws.org